
# පරිසර දින දසුනේ වැදගත් දින කිහිපයක්



ලෝව කාර්මික හා කෘෂිකාර්මික දියුණුව ඇතිවීමත් සමග එහි අහිතකර ප්‍රතිඵල ලෙස ස්වාභාවික සම්පත් හීන වීමත් පරිසරයට අපද්‍රව්‍ය එක්වීමත් බහුල ලෙස සිදු විය. වසර 1969 පමණ වනවිට කාර්මිකරණයේ මෙම අහිතකර ප්‍රතිඵල (විශේෂයෙන්ම කෘෂිරසායනික භාවිතයේ ප්‍රතිවිපාක) පිළිබඳ ජනතා අවධානය යොමුවීම ආරම්භ විය. ජන අවධානය පරිසරය වෙත යොමුවත්ම පාරිසරික ගැටළු එක් ප්‍රදේශයකට හෝ රටකට පමණක් සීමා වූ ඒවා නොවන බව අවබෝධ කර ගන්නට ලෝක ප්‍රජාව සමත් විය. මේ නිසා පාරිසරික ගැටළුවට පිළියම් යෙදීමේදී ලෝක ප්‍රජාව එක්ව සංවිධානය වී කටයුතු කිරීමටත්, අන්තර් ජාතික සම්මුතින් හා සන්ධාන ඇතිකර ගැනීමටත් කටයුතු කළහ.

## මානව පරිසරය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මන්ත්‍රණය - 1972

මිනිස් අවධානය වැඩි වැඩියෙන් පරිසරය වෙත යොමු වෙද්දී එක්සත් ජතීන්ගේ මහ සභාව විසින් ප්‍රථම පාරිසරික සමුළුව 1972දී ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවරදී පවත්වන ලදී. මානව පරිසරය නම් වූ මෙම සමුළුවට ලෝකයේ රටවල් රැසක් සහභාගි වූහ. මෙහිදී ගෝලීය පරිසරය සුරැකීම සඳහා එක්ව කටයුතු කිරීමට මෙයට සහභාගිවූ රටවල් එකඟතාවයකට එළඹිණි. එමෙන්ම මෙම සමුළුවේ ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහන (**UNEP**) ආරම්භ වීමද සිදු විය.

## පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුව (UNCED) 1992

ප්‍රථම පාරිසරික සමුළුව පවත්වා වසර 20ට පසු එනම් 1992 ජුනි මස 3-14 දක්වා බ්‍රසීලයේ රියෝද ජැනයිරෝහිදී දෙවන පාරිසරික සමුළුව පැවැත්වුණි. මේ සඳහා රටවල් 178 ක නියෝජිතයින් සහභාගි වූහ. පරිසර හා සංවර්ධනය තේමා කොට ගත් මෙම රියෝ සමුළුවේදී පාරිසරිකව වැදගත් ප්‍රතිඵල රැසක් ඇතිවුණි. මෙහි ප්‍රතිඵල ලෙස පරිසරය හා සංවර්ධනය පිළිබඳ රියෝ ප්‍රකාශනය, හා (**Agenda** 21)නම් වූ විසි වන සියවස සඳහා වූ පරිසර ක්‍රියාත්මක සැලැසුමත්, දේශගුණික විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ රාමුගත වැඩපිළිවෙල සේම ජෛව විවිධත්ව සම්මුතිය, වනාන්තර සිද්ධාන්ත පිළිබඳ ප්‍රකාශය ඇතිකිරීමද සිදු විය.

## ධරණීය සංවර්ධනය පිළිබඳ ජොහැන්ස්බර්ග් සමුළුව - 2002

ධරණීය සංවර්ධනය තේමා කර ගත් මෙය රියෝ සමුළුව පවත්වා දශකයකට පමණ පසු 2002 අගෝස්තු 26 සිට සැප්තැම්බර් 04 දක්වා දකුණු අප්‍රිකාවේ ජොහැන්ස්බර්ග් නුවරදී පැවැත්වුණි. මෙහිදී 1992 පැවති සමුළුව පිළිබඳ විවරණය කරන ලද අතර ධරණීය සංවර්ධනය සඳහා තවදුරටත් බැඳීම් ඇතිකර ගැනීමත් සිදු විය. මෙම සමුළුවේදී ප්‍රධාන ලේඛන දෙකක් සම්මත කර ගන්නා ලදී. ධරණීය සංවර්ධනය සඳහා ජොහැන්ස්බර්ග් ප්‍රකාශය හා රියෝ මිහිතල සමුළුවේ තීරණ ක්‍රියාත්මක කිරීමේ සැළැස්ම මෙහිදී එළි දක්වන ලදී.

මෙලෙස සමුළු හා සම්මන්ත්‍රණ පවත්වමින් පාරිසරික කරුණු පිළිබඳ සම්මුති හා සන්ධාන ඇතිකර ගැනීමටත් පරිසරය සුරැකීමට ක්‍රියාත්මක සැලසුම් සකස් කිරීමටත් ලෝක ප්‍රජාව එක් වී පියවර ගන්නා ලදී.එමෙන්ම අවධානය වැඩියෙන් යොමු විය යුතු කරුණු පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීම සඳහා විශේෂිත දින ප්‍රකාශයට පත් කර ඒවා සැමරීමටත් කටයුතු කරන ලදී. දින දසුනේ විශේෂිත වූ පරිසර දින කිහිපයක ආරම්භය පහත දැක්වේ.

## ලෝක තෙත් බිම් දිනය (World Wetlands Day) පෙබරවාරි 02

1971දී ඉරානයේ රම්සා නුවරට රැස් වූ ලෝක ප්‍රජාව තෙත් බිම් රැක ගැනීම සඳහා වූ සම්මුතියකට (තෙත් බිම් සම්මුතියට ) අත්සන් තබන ලදී. රම්සා සම්මුතියට අත්සන් තබන ලද පෙබරවාරි මස 02වැනි දින ලෝක තෙත් බිම් දිනය ලෙස නම් කර ඇත.

ප්‍රථමයෙන්ම 1997 වර්ෂයේ සමරන ලද මෙම දිනය ඉන් පසු සෑම වසරකම ලෝකයේ විවිධ රටවල් වල රජයන් රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සංවිධාන විසින් සමරනු ලබයි. තෙත් බිම්



පරිසරයේ ඇති වැදගත්කම හා එමගින් සැලසෙන වාසි පිළිබඳ ජනතාව දැනුවත් කිරීම තුළින් තෙත් බිම් රැක ගැනීම හා එය බුද්ධිමත්ව පරිහරණය කිරීමට පෙළඹවීම සඳහා මෙම දිනය යොද ගැනේ. තෙත් බිම් සැමරීම් වැඩ සටහන් අතර තෙත් බිම් පුනරුත්ථාපනය කිරීමත් , අලුතෙන් රම්සා තෙත් බිම් (අන්තර්ජාතිකව වැදගත් තෙත් බිම්) නම් කිරීමත් වැදගත් තැනක් ගනී.

### ලෝක ජල දිනය (World Day for Water) මාර්තු 22

පරිසරය හා සංවර්ධනය පිළිබඳ ලෝක සමුළුවේදී ඉදිරිපත් කරන ලද 21 වන න්‍යාය පත්‍රයේ නිර්දේශයන්ට අනුකූලව ජලය පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීමට එක්සත් ජාතින්ගේ මහා සභාව පියවර ගන්නා ලදී. එබැවින් සෑම වසරකම මාර්තු 22 වැනි දින ලෝක ජල දිනය ලෙස ප්‍රකාශයට පත්කර එය සැමරීමට කටයුතු කරනු ලැබේ. ජල සංරක්ෂණයේ වැදගත්කම, ජල සම්පත් සංවර්ධනය හා 21 වන න්‍යාය පත්‍රයේ නිර්දේශ ක්‍රියාවට නැංවීම ආදී කරුණු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙම දිනයේ ප්‍රධාන අරමුණයි.

### ලෝක මිහිතල දිනය (World Earth Day) අප්‍රේල් 22

වසර 1970 අප්‍රේල් 22 දින ඇමරිකාවේ විශ්ව විද්‍යාල සිසුන් පිරිසක් පරිසර දූෂණයට එරෙහිව උද්ඝෝෂණයක් ආරම්භ කළහ. එහි ප්‍රතිඵලයක් ලෙස පාරිසරික කරුණු පිළිබඳව ප්‍රථම වරට දේශපාලන අවධානයක් යොමු විය. එම උද්ඝෝෂණය පැවැත් වූ අප්‍රේල් මස 22 දින ලෝක මිහිතල දිනය ලෙස නම් කරන ලදී.

### අන්තර් ජාතික ජෛව විවිධත්ව දිනය (International Day for Biodiversity) මැයි 22

ජෛව විවිධත්ව සම්මුතිය බලාත්මක කරන ලද දෙසැම්බර් මස 29 වන දින ජෛව විවිධත්ව දිනය ලෙස මුලින් නම් කෙරුණද 2000 වසරේ සිට එය මැයි මස 22 දින ලෙස වෙනස් කරන ලදී. ජෛව විවිධත් ව සම්මුතියේ අවසාන කෙටුම්පත නීතිගත කරන ලද මැයි මස 22 සිහිපත් කිරීම සඳහා මැයි 22 දින ජෛව විවිධත්ව දිනය ලෙස තෝරා ගෙන ඇත. ජෛව විවිධත්වය හා සම්බන්ධ ගැටළු පිළිබඳ දැනුමක් හා අවබෝධයක් ලබා දීමටත්, ජෛව විවිධත්ව සංරක්ෂණයේ වැදගත්කම හුවා දැක්වීමටත් අන්තර්ජාතික ජෛව විවිධත්ව දිනය උපයෝගී කර ගනී.

### ලෝක පරිසර දිනය (World Environment Day) ජුනි 05

ලොව ප්‍රථම පරිසර සමුළුව වූ ස්ටොක්හෝම් සමුළුව ආරම්භ වූ ජුනිමස 05 වන දින් ලෝක පරිසර දිනය ලෙස නම් කිරීමට එක්සත් ජාතින්ගේ මහා සභාව කටයුතු කරන ලදී. සෑම වසරකම විවිධ පාරිසරික තේමාවන් ඔස්සේ පරිසර දිනය සමරන අතර ලොව පුරා ජනතා හා දේශපාලන අවධානය පරිසරය කෙරෙහි යොමු කිරීම මෙම දිනයේ ප්‍රධාන අරමුණයි.

### කාන්තාරකරණය හා නියගය පිටුදැකීම පිළිබඳ ජාත්‍යන්තර දිනය (World Day to Combat Desertification) ජුනි 17

කාන්තාරකරණය හා නියගය පිටු දැකීම සඳහා වූඅන්තර්ජාතික සම්මුතියට අත්සන් තබන ලද ජුනි මස 17 දින සිහිපත් කරමින් කාන්තාරකරණය හා නියගය පිටු දැකීම පිළිබඳ ජාත්‍යන්තර දිනය ජුනිමස 17 වන දිනට යොද ගෙන ඇත. ලොව පුරා විවිධ රටවල රජයන් ,රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සංවිධාන මෙම දිනය සැමරීම සඳහා නොයෙක් ක්‍රියාකාරකම් වල නිරත වේ. භූමිය හානිවීම, කාන්තාරකරණය හා නියගය නිසා ඇතිවන සමාජ ආර්ථික හා පාරිසරික ගැටළු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා මෙම දිනය යොද ගැනේ.

### ආදිවාසීන් පිළිබඳ අන්තර්ජාතික දිනය (International Day of the worlds Indingenous People) අගෝස්තු 09

එක්සත් ජාතින්ගේ මහ සභාව විසින් 1994 සිට දශකයක කාලයක් ආදිවාසීන්ගේ දශකය ලෙස නම් කරන ලදී. මෙම දශකය තුළ සෑම වසරකම අගෝස්තු මස 09 දින ආදිවාසීන්ගේ දිනය ලෙස නම් කර එය සැමරීමට කටයුතු යොදන ලදී. එම දශකය අවසන්

වූ පසු තවත් දශකයක් පුරාම එම දිනය සැමරීමට කටයුතු යොදා ඇත. ලොව පුරා වෙසෙන ආදිවාසීන්ගේ සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍ය, මානව හිමිකම්, පරිසරය හා ආර්ථික සංවර්ධනය ඇති කිරීම සඳහා අන්තර්ජාතික සහයෝගිතාවය ශක්තිමත් කිරීම මෙම දිනයේ අරමුණයි.

## ඕසෝන් ස්ථරය රැකීම සඳහා වූ අන්තර් ජාතික දිනය (International Day for the preservation of Ozone layer) සැප්තැම්බර් 16

ඕසෝන් ස්ථරයට හානි කරන නිෂ්පාදන හා ඒවායේ භාවිතය ක්‍රමයෙන් අඩු කිරීම හා නතර කිරීම සඳහා 1987දී මොන්ට්‍රියෙල් නුවරදී සන්ධානයකට අත්සන් තබන ලදී . මෙම මොන්ට්‍රියෙල් සන්ධානයට අත්සන් තබන ලද සැප්තැම්බර් මස 16 වැනි දින ඕසෝන් වියන රැක ගැනීම සඳහා වූ අන්තර් ජාතික දිනය ලෙස නම් කර ඇත. මොන්ට්‍රියල් සන්ධානයේ හා ඊට පසු එයට එක් වූ සංශෝධන වල අඩංගු ඕසෝන් ස්ථරය රැක ගැනීමේ ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මෙම දිනය යොදා ගැනේ.

## ජාතික රුක් රෝපණ දිනය (National Tree Planting Day) ඔක්තෝබර් 15

ශ්‍රී ලංකාවට මෝසම් වැසි ලැබෙන ඔක්තෝබර් මාසය ජාතික රුක් රෝපණ මාසය ලෙස නම් කර ඇති අතර ඔක්තෝබර් මස 15 වැනි දින ජාතික රුක්රෝපණ දිනය ලෙස නම් කර ඇත. ජාතික මට්ටමින් සමරනු ලබන මෙම දිනයේ අරමුණ වන්නේ ගහ කොළ සුරැකීමේ වැදගත්කම පැහැදිලි කරමින් ජනතාව වැඩි වැඩියෙන් රුක් රෝපණය සඳහා පොළඹවා ගැනීමයි. ජාතික රුක් රෝපණ මාසය තුළ නොයෙකුත් රුක් රෝපණ වැඩ සටහන් ජාතික හා ප්‍රාදේශිය මට්ටමින් පැවැත් වේ.

## අන්තර් ජාතික කඳුකර දිනය (International Mountain Day) දෙසැම්බර් 11

එක්සත් ජාතීන්ගේ කඳුකර වර්ෂය ලෙසින් නම් කරන ලද, 2002 වසරේ සිදු කරන ලද ක්‍රියාකාරකම් වල සාර්ථකත්වයේ ප්‍රතිඵලයක් ලෙස සෑම වසරකම දෙසැම්බර් මස 11 වන දින අන්තර් ජාතික කඳුකර දිනය ලෙස නම් කිරීම එක්සත් ජාතීන්ගේ මහ සභාව විසින් පියවර ගෙන ඇත.

කඳුකරයේ වැදගත්කම හුවා දැක්වීමටත්, කඳුකර සංවර්ධන කටයුතු සඳහා ඇති අවස්ථාවන් හා බාධාවන් පිළිබඳව දැනුවත් කිරීමත් කඳුකර ප්‍රදේශ වල තිරසාර සංවර්ධනය ඇති කිරීමට හවුල් කරුවන් එක් රැස් කිරීමටත් කඳුකර දිනය අවස්ථාවක් කර ගනී.

**N.D. වික්‍රමාරච්චි**
**පරිසර සහකාර**
**පරිසර අමාත්‍යාංශය**

